සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

# වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 9 | විෂයය / பாடம் / Subject: ක්‍රිස්තු ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II | කාලය / காலம் / Time: පැය 02 |

නම :- ........................................................................................ විභාග අංකය :- ...........................

සැලකිය යුතුයි:
- නිවරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) මැවිල්ලේම මුදුන් මල්කඩ වන්නේ,
(1) දෙවියන් වහන්සේ (2) මිනිසා
(3) ජේසුස් වහන්සේ (4) සතුන්

(02) 'දේව මුඛය' ලෙස හඳුන්වන්නේ,
(1) දිවැසිවරු (2) මිනිසා (3) රජවරු (4) පූජකවරු

(03) 'ආලෝකයට' සාක්ෂි දැරීමට පැමිණියේ,
(1) ජේසුස් වහන්සේ (2) ගෝලයන්
(3) ස්නාවක ජොහාන් (4) පූජකවරු

(04) ක්‍රිස්තු ශරීරය තුළින් සංකේතවත් කරන්නනේ,
(1) ශුද්ධ වූ සභාව (2) ප්‍රේරිතයන් (3) පූජකවරු (4) රොටි

(05) 'යෙසෙයා' යන්නෙහි අදහස වන්නේ,
(1) දෙවියන් වහන්සේගේ දායාදය (2) වතුරෙන් ගොඩගත්
(3) දෙවියන් වහන්සේ විසින් ඔසවා ගත් (4) යහ්වේ විමුක්තිය වන සේක

(06) ''මා නුඹ කුසෙහි පිළිසිඳ ගැනීම ඇති කරන්නටත් පෙර නුඹ හඳුනා ගතිමි'' මෙසේ දේව පැවසුවේ,
(1) යෙසායා (2) ජෙරමියා (3) මීකා (4) ආමෝස්

(07) 'බිබ්ලියා' යන වචනෙහි අරුථ වන්නේ,
(1) බයිබලය (2) පොත් (3) පුස්තකාලය (4) ප්‍රේමය

(08) බයිබලය තුළ ඇති කේන්ද්‍රීය තේමාව වන්නේ,
(1) දෙවියන් වහන්සේගේ වචනය
(2) කිතුනුවන් අනුගමනය කලයුතු නීති
(3) දෙවියන්වහන්සේ හා මිනිසා අතර සම්බන්ධතාව
(4) ඓතිහාසික සිදුවීම් රැස

Department of Education – Western Province

(09) පාවුල් තුමා විසින් ලියා ඇති හසුන් පත් ගණන වන්නේ,

(1) 13 කි (2) 21 කි (3) 12 කි (4) 29 කි

(10) පැරණි ගිවිසුමේ ග්‍රීක පිටපත හඳුන්වන නම වන්නේ,

(1) වල්ගේට් (2) ඇන්ලෝ
(3) මැසෝරටික් (4) සෙප්තුවාජින්ත

(11) ''ඔබගේ වචනය මාගේ දෙපයට පහනක්ය. මාගේ මාවතට එළියක්ය'' මෙම පාඨය ඇතුළත් වන බයිබල් ග්‍රන්ථය වන්නේ,

(1) ගීතාවලිය (2) ශු.මතෙව් (3) හිතෝපදේශ (4) එළිදරව්ව

(12) ශුද්ධාත්ම ආගමනය සිදුවූයේ,

(1) පාස්කු දින (2) පෙන්තකොස්ත දින
(3) මහ සිකුරාදා (4) එය අදටත් සිදුවේ

(13) මුල් කිතුනු සභාවේ නායකයා වන්නේ,

(1) ජාකොබ් (2) මරියතුමි
(3) මතෙව් (4) පේදුරු

(14) මුළු ඊශ්‍රාලයෙම එකීය රාජ්‍යයක් බවට පත්වූ රාජ්‍ය පාලන සමය,

(1) සලමොන් (2) සාවුල්
(3) දාවිත් (4) රෙහ්බෝවම්

(15) පැරණි ගිවිසුමේ 'සුළඟ' මගින් සංකේතවත් කරන්නේ,

(1) දෙවියන් වහන්සේගේ වැඩසිටීම (2) දේවාත්මයාණන්ගේ හැසිරීම
(3) ශුද්ධාත්ම බයිබලය (4) දේව බලය

(16) බයිබලය මුලින්ම ලියවුණේ,

(1) කොළවල (2) පැපිරස් පත්‍රවල
(3) ගල් පුවරු මත (4) හම් වල

(17) අයුක්තිය, අසාධාරණයට විරුද්ධව කථාකළ දිවැසිවරයා වන්නේ,

(1) යෙසායා (2) ආමොස් (3) මීකා (4) හොෂියා

(18) දෙවියන් වහන්සේගේ සේවය වෙනුවෙන් අප ක්‍රියා කිරීමේදී විරෝධතා පැමිණි විට අප කළ යුත්තේ,

(1) දේව සේවය නතර කිරීම
(2) ඔවුන් සතුටු දේ කිරීමට උත්සහ කිරීම
(3) දේව ඇදහිල්ල තුල තම සේවය ඉරිදියට ගෙන යාම
(4) වෙනත් සේවයක් තුලින් දේව වචනය කියා දීම

Department of Education – Western Province

(19) හෝෂියා දේව පණිවුඩය කියා දීමට භාවිතා කළ උපක්‍රමයක් වන්නේ,

(1) තම දරුවන්ට තැබූ නම් වලින් දේව පණිවිඩය කියා දම
(2) නව චාරිත්‍ර වාරිත්‍ර කියා දීම
(3) උපමා කථා භාවිතය
(4) හාස්කම් කිරීම තුළින්

(20) ජේසුස් වහන්සේ දේශනා කිරිමට හා ඉගැන්වීමට යොදාගත් භාෂාව වනුයේ,

(1) ග්‍රීක (2) හෙබ්‍රෙව් (3) ඉංග්‍රිසි (4) ඇරමීය

## <u>II කොටස</u>

- **පළමු ප්‍රශ්නය හා තොරාගත් තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**

(01) අනිවාර්ය ප්‍රශ්නය

(1) බයිබලයේ නිති පොත් දෙකක් සඳහන් කරන්න.
(2) 'හෝෂියා' යන නමෙහි අර්ථය ලියන්න.
(3) 'මෑත අතීතයේ, දේව රාජ්‍යය' වෙනුවෙන් තම ජීවිතය කැපකල පුද්ගලයින් 02ක් ලියන්න.
(4) බයිබලයේ 'සම්මත ග්‍රන්ථ' ලෙස සලකන්නේ මොනවා ද?
(5) ''පොළවේ සීමාන්තය දක්වා මාගේ සාක්ෂිකාරයෝ වන්න'' මින් ජේසුස් වහන්සේ තේරුම් කළේ කුමක් ද?
(6) ශ්‍රී ලංකා බයිබල් සමාගමේ අරමුණ සඳහන් කරන්න.
(7) ශුද්ධාත්මයාණන්ගේ බලයෙන් පණ ගැන්වුණු ශ්‍රාවකයන්ගේ ජීවිතවල කැපී පෙනෙන ලක්ෂණ දෙකක් ලියන්න.
(8) සාකෙවස් ආලෝකයට සාක්ෂි දැරූ ආකාර 2ක් ලියන්න.
(9) නව තාක්ෂණය තුළින් දේව රාජ්‍යය ගේ රාජ්‍ය ප්‍රචලිත කළ හැකි ආකාර දෙකක් සඳහන් කරන්න.
(10) දිවැසිවර අමොස් දුටු දර්ශන දෙකක් සඳහන් කරන්න.

(ලකුණු10 x2 = 20)

(02) (1) දිවැසිවරු යනු කවුද? (ලකුණු02)
(2) දිවැසිවර කාර්ය භාරයන් තුනක් ලියන්න (ලකුණු03)
(3) කිතුනු කිසිවකු ලෙස ඔබ දිවැසිවර කාර්යභාරය ඉටු කරන්නේ කෙසේ දැයි ජෙරමියා හා ආමෙස් යන දිවැසිවරු උදාහරණ ලෙස ගනිමින් විස්තර කරන්න. (ලකුණු05)

(03) (1) ශු. බයිබලය විසින් අනාවරණය කරන කරුණු දෙකක් ලියන්න. (ලකුණු02)
(2) බයිබලය ලියැවුණු ආකාර තුනක් ලියන්න. (ලකුණු03)
(3) බයිබලය තුලින් ඔබගේ ජීවිතය ආලෝකමත් වන්නේ කෙසේදැයි පැහැදිලි කරමින් මිතුරෙකුට ලිපියක් ලියන්න. (ලකුණු05)

(04) (1) මුල් සභාව විසින් කළ ප්‍රථම ප්‍රාතිහාර්ය කුමක් ද? (ලකුණු02)
(2) දේව රාජ්‍ය පුරවැසියන්ගේ ලක්ෂණ 3ක් සඳහන් කරන්න. (ලකුණු03)
(3) වර්තමානයේ ප්‍රාතිහාර්යයන් පිටුපස ගමන් කරන කිතුනුවන්ව නිවැරදි මාර්ගය පෙන්වීම උදෙසා ඔබට ගත හැකි ක්‍රියාමාර්ග 5ක් ලියන්න. (ලකුණු05)

Department of Education – Western Province

(05) (1) මීකා යන නමෙහි අරුත ලියන්න. (ලකුණු02)

(2) මීකා පැවසූ පරිදි සාමය ඇති කිරීම සඳහා අවශ්‍ය මනුෂ්‍යයාගේ ත්‍රිවිධාකාර ක්‍රියාකාරිත්වය කුමක් ද? (ලකුණු03)

(3) ''යුද්ධයෙන් පෙළෙන ලෝකය තුළ ආලෝකයක් වන කිතුනුවෙකු'' යන මාතෘකාව මුල්කරගෙන සාමය ඇතිකළ ආකාර පහදමින් පුවත්පතකට සඟරාවක් ලියන්න. (ලකුණු05)

(06) (1) බයිබලයේ ආලෝකයට සාක්ෂි දරූ පුද්ගලයින් දෙදෙනෙක් ලියන්න. (ලකුණු02)

(2) ජෝන් නිව්ටන් නැමැති මෑත කාලයේ ආලෝකයට සාක්ෂි දරූ පුද්ගලයා ගැන කරුණු 3ක් ලියන්න. (ලකුණු03)

(3) මීතොටමුල්ල කුණු කන්ද වැනි ආපදා හමුවේ ඔබ ආලෝකයක් වන්නේ කෙසේදැයි පහදන්න. (ලකුණු05)

(07) පහත මාතෘකා දෙකකට කෙටිසටහන් ලියන්න.

(1) පෙන්ත කොස්ත දින සිදුවීම

(2) ශුද්ධ වූ බයිබලය හා එහි අන්තර්ගතය

(3) යෙසායාගේ කැඳවීම

(4) ශුද්ධාත්ම මග පෙන්වීමට විවෘත වෙමු

(ලකුණු2 X5 = 10)

Department of Education – Western Province